25

# ආර්ථිකය ගැන ඉස්ලාම් දහමේ අනුශාසනය

فَإِذَا قُضِيَتِ الصَّلَاةُ فَانْتَشِرُوا فِي الْأَرْضِ وَابْتَغُوا مِنْ فَضْلِ اللَّهِ وَاذْكُرُوا اللَّهَ كَثِيرًا لَعَلَّكُمْ تُفْلِحُونَ (الجمعة)

**" සලාතය නිම කළ ලැබූ විට මහපෙළොවෙහි විසිර යනු. අල්ලාහ්ගේ වරප්‍රසාදයෙන් සොයනු. තව ද අල්ලාහ් අධිකව සිහිපත් කරනු. නුඹලා ජයග්‍රාහකයන් වනු. " (62 අල් ජුමුආ :10)**

ඉස්ලාම් දහම සම්පූර්ණ වූ ජීවන රටාවකි. මෙය ජීවිතයේ සියලු ම අංශ කෙරෙහි මග පෙන්වයි. එම මග පෙන්වීම් නොසලකා හැරීම හෝ කොටසක් ප්‍රතික්ෂේප කර තවත් කොටසක් අනුගමනය කිරීම ද වැරදි සහගත වනවා පමණක් නොව බලාපොරොත්තු වුණු ජයග්‍රහණය ද ලබා නොදීමට හේතු වේ. මේ නිසා ඉස්ලාම් දහම සම්පූර්ණයෙන් පිළිපැද සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. ඉස්ලාම් දහමේ ආර්ථික න්‍යාය (පමණක්) ඉස්ලාම් නොවන හෝ නාමික වශයෙන් ඉස්ලාම් දහම දකින සමාජයක කිරීම අභියෝගාත්මක වේ. එලෙසට නූතන ආර්ථික න්‍යායන් සමග එය මිශ්‍ර කිරීට උත්සාහ දැරීම ද වැරදිය.

ඉපැයීම ඉස්ලාම් දහම මග පෙන්වන එක් අංශයකි. එහි අනෙකුත් අංශ වන සමාජයක ඉස්ලාමීය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන විට සාධනීය ප්‍රතිඵලය ලඟාකරගත හැක.

මිනිසා ආත්මය හා ශරීරය යන කොටස් දෙකෙන් සැදුම් ලත්තේ ය. එනිසා මේ දෙක අතර සමබරතාව රැකීම තුළින් සැබෑ දියුණුව ලඟා කරගත හැකි බව ඉස්ලාම් දහමේ තවත් එක් මූලික මතයකි. එහෙයින් මිනිසාගේ ආර්ථික අවශ්‍යතා ඉපැයීම යනු මිනිසාගේ අවශ්‍යතා භෞතික වශයෙන් පරිපූර්ණ කරගැනීම සඳහා වූ ක්‍රමයකි. තව ද ජීවිතයේ ඉලක්ක ලඟා කර ගැනීමට ද මෙය අත්‍යවශ්‍ය ය. නමුත් කායික අවශ්‍යතා සපුරාලීම මගින් පමණක් ජීවිතයේ සියලු ඉලක්ක සපුරාලන්නේ නැත.

ඉස්ලාමය ඒක දේව වාදය පදනම් වූ ආගමක් වශයෙන් ෂිර්ක් පිළිගන්නේ නැත. එම නිසා දේපළ නිසා ඊමානයට බලපෑම් ඇති වන්නේ නම් එම තත්ත්වය මග හැරිය යුතු බව ඉස්ලාමය අවධාරණය කරයි. මුදල් හෝ දේපළ දේවත්වයෙන් සළකා නැමදීම ඉස්ලාම් අනුමත කර නොමැත.

## ඉපයීමේ දී වැළකී සිටිය යුතු කරුණු

අනුමත කරන ලද කුමන ඉපැයුම් මගක නිරතවන්නකු වූව ද සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් ගැන ඉස්ලාම් පැහැදිලි ව පෙන්වා දී ඇත. මෙම කරුණු ප්‍රතික්ෂේප කර උපයන පුද්ගලයින් පරලොව දී පව් කළ අය සමග නැගිටිනු ඇත, යන්න ගැන හදීස් අවවාද කරයි.

"වෙළෙඳුන්ගෙන් කවරකු අල්ලාහ් හට බිය වී, සත්‍ය ක්‍රියා, කුසල් කරන්නේ ද ඔවුහු හැර අන් අය පව් කළවුන් ලෙස නැගිටුවනු ලැබේ (තිර්මිදි, ඉබ්නු හිබ්බාන්.)"

"වෙළෙන්දනි! බොරුව සම්බන්ධයෙන් ඔබට අවවාද කරමි" (අත්තබරානි)

**දැන් රැකියා කිරීමේදී වැලී සිටිය යුතු කරුණු පිළිබඳ අවධානය යොමු කරමු.**

### රැවටීම

ඉපැයීමේ දී කිරුම් මැනුම් නිරවද්‍ය විය යුතු බවට මගපෙන්වන ඉස්ලාමය රැවටීම, වංචාව වැනි වැරදි ක්‍රියාවලින් උපයා ගැනීම් වළක්වා ඇති බව තහවුරු කරයි. පහත සඳහන් අල් කුර්ආන් වැකිය ඊට සාක්ෂි දරයි.

"නුඹලා මනින්නේ නම් සම්පූර්ණයෙන් ම මනින්න, (කිරන්නේ නම්) නිවැරදිව බරතබා කිරන්න." (7 අල් අඃරාෆ් 85)

"කිරුම් මැනුම් වල දී වංචා කරන්නන් හට විනාශය අත් වේ. ඔවුන් මිනිසුන්ගෙන් මැන ලබා ගැනීමේ දී වැඩියෙන් මැන ලබා ගන්නෝ ය. අන් අයට මැන දෙන විට අඩු කර දෙති. ඔවුන් ගෞරවනීය දිනයක ස්ථිර ව ම නැගිටුවන බව විශ්වාස කළේ නැද්ද? එදින ඔවුහු විශ්වයේ අධිපති ඉදිරියේ ( විමර්ශනයට) සිටගනිති." (83 අල් මුතෆ්ෆෆීන් :1-6)

භාණ්ඩ මැනීමේ ක්‍රියාවලියේ දී අවංකව හා ශිලාචාරව ක්‍රියා කිරීම අවශ්‍යය. මෙය පහත නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වදන තුළින් තව දුරටත් පැහැදිලි කර ගත හැක.

"විකුණන විට, මිල දී ගන්නා විට, හෝ තම අයිතිවාසිකම් ඉල්ලා සිටින විට සාධාරණව කටයුතු කරන මිනිසා වෙත අල්ලාහ් දයාව කරත්වා! යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි සල්ලම් තුමා ප්‍රාර්ථනා කළේ ය." (බුහාරි, තිර්මිදි)"

## ව්‍යාජ දිවුරුම

ඉපැයිමේ දී වැළැකී සිටිය යුතු කරුණු වලින් ව්‍යාජ ලෙස දිවුරීම එකකි. මේලෙස කිරීම අල්ලාහ් ට අගෞරව කිරීමක් වනවා පමණක් නොව පාරිභෝගික පොදු ජනයා රවටන ක්‍රියාවකි. ඉස්ලාම් මෙම ක්‍රියාව තහනම් කරන්නේ මේනිසා ය.

"(ව්‍යාජ) දිවරුම් දීම භාණ්ඩවල ඉල්ලුම් ඇති කළත් බරකතය විනාශ කරයි." (බුහාරි)

"(වෙළෙඳාමේ දී) දිවිරීම, භාණ්ඩය විකිනීමට සලස්වයි. (නමුත්) ලාභය විනාශ කරයි." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛයිහිවසල්ලම් තුමා පැවසුවේ ය. (මුස්ලීම්, නසායී, අහ්මද්, අබූදාවූද්)

මෙලෙස විකුණන භාණ්ඩවල නොතිබෙන දේ තිබෙන බවට දිවුරීම කියාමත් දිනයේ දී කෙතරම් විශාල හානියක්, අලාභයක් ඇති කරයි ද යන්න, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පහත සඳහන් අයුරින් පැහැදිලි කළේ ය.

කියාමා දිනයේ දී තිදෙනකු දෙස අල්ලාහ් බලන්නේ නැත. ඔවුන් පවිත්‍ර කරන්නේ ද නොමැත. ඔවුන්ට වේදනාකාරී දඬුවම් ඇති බව පැවසීය. ඒ තිදෙනා අතර කෙනකු තමාගේ විකුණුම් භාණ්ඩවල නොමැති දේ තිබෙන බවට ව්‍යාජ දිවුරුම් කළ නැමැත්තා ද වේ. ( බුහාරි)

"කෙනකු දිවුරා එමගින් තමන් මුස්ලිම්වරයකුගේ දේපළ උදුරා ගත් නිසා ඔහු බොරුකාරයකු නම් කියාමා දිනයේ දී ඔහු කෙරෙහි කෝපයෙන් සිටින අල්ලාහ් හමුවේ." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසුවේ ය. ( බුහාරි, මුස්ලිම්)

අල් කුර්ආනය පහත පරිදි පවසයි.

"ඔබ අතර (එකිනෙකා) ඔබේ භාණ්ඩ වැරදි අයුරින් අනුභව නොකරනු." (2අල් බකරා :188)

"අල්ලාහ්ගේ දූතයාණනී, අල්ලාහ් වෙළඳාම අනුමත කර ඇත්තේ නොවේ ද? යනුවෙන් සහාබාවරු ප්‍රශ්ණ කළහ. එය ඇසූ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා "ඔවු, නමුත් ඔවුහු දිව්රා පවු කරති. කථා කරන විට බොරු කියති." යනුවෙන් පැවසූහ. (අහ්මද්)

## සැඟවා තැබීම

භාණ්ඩ තොග සැඟවා තැබීම ඉස්ලාමයේ තහනම් කර ඇත. වෙළඳපොළ මිළ ඉහළ යාම සඳහා භාණ්ඩ තොග සැඟවා තැබීම හරාම් වේ. යමකු තුළ ඇති තණ්හාව, භාණ්ඩයක් වෙනුවෙන් අන් අයගේ සුභ සිද්ධිය නොසැලකීම වැනි වැරදි සිඳුවීමට හේතු කාරක වේ. එම නිසා ඉස්ලාමය භාණ්ඩ තොග සැඟවා තැබීම තරයේ හෙළා දකියි.

භාණ්ඩ තොග සැඟවා තැබීමේ බරපතල කම පිළිබඳ පහත සඳහන් හදීස් අපට පැහැදිලි කෙරේ.

"අවශ්‍ය භාණ්ඩ තොග නොසඟවා සුදුසු වෙලාවට වෙළෙඳපොළ වෙත රැගෙන එන පුද්ගලයා අල්ලාහ්ගේ දයාදය ට පාත්‍ර වූවෙකි. තව ද අල්ලාහ් ඔහුට ජීවනාධාරලබා දෙන්නේ ය. තව ද ඒවා සඟවා තබන්නා අල්ලාහ්ගේ සාපයට ලක් වූවෙකි," යනුවෙන් පැවසීය. (ඉබ්නු මාජා)

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පැවසූ වග නම් "අවශ්‍ය භාණ්ඩ සඟවා තබන්නා කෙතරම් අසත් පුරුෂයකු ද? අල්ලාහ් භාණ්ඩ මිළ අඩුකළ විට ඔහු දුකට පත්වෙයි. මිළ වැඩි වූ විට සතුටට පත් වේ." (බෛහකි)

"භාණ්ඩ සැඟවා තබන්නා පාපියෙකි. " (මුස්ලිම් අබූදවූද්)

"අවශ්‍ය ආහාර භාණ්ඩ දින 40කට සැඟවා තබන්නා අල්ලාහ් හැර වෙන් වී යන්නේ ය. අල්ලාහ් මොහුගෙන් වෙන් වී සිටී" (අහමද්, අල්හාකිම්)

"ඉතාමත් නපුරු යටත් වැසියා භාණ්ඩ සඟවා තබන්නා වේ. මිළ අඩු වූ බව ඇසුණු විට ඔහු දුක් වේ. මිළ වැඩි වූ බව ඇසුණු විට ඔහු සතුටු වේ." (රසීන්)

## පොළිය

ඉස්ලම් පොළිය මහා පාපයන් ගේ ලැයිස්තුවෙන් එකක් ලෙස සැලකයි.

ණය මුදලේ වටිනාකම ට වැඩියෙන් ලබා ගන්නා අගය පොළිය ලෙස හැදින් වේ. මෙය පහත අල් කුර්ආන් වැකිය පැහැදිලි කරයි.

"නමුත් නුඹලා (පොළිය ගැනීම පිළිබඳ) වැරද්ද වටහාගෙන එයින් ඉවත් වන්නේ නම් නුඹලාගේ ධනයේ මූලික කොටස ඔබට ඇත." (2 අල් බකරා :279)

පොළිය ගැනීම හා දීම ඉස්ලාමය තදින් හෙළා දකී. වෙන අපරාධ වලට නොමැති මට්ටමින් පොළිය අල්ලාහ් සමඟ යුද වදිනා වැනි ක්‍රියාවක් බව අල් කුර්ආනයෙහි අවවාද කරන්නේ ය.

"විශ්වාසවන්තයිනී! නුඹලා මුඃමින්වරු නම් අල්ලාහ්ට බිය වී ඉතිරි පොළිය නො ගෙන අත්හරින්න. එලෙස නුඹලා නොකරන්නේ නම් අල්ලාහ්ගෙන් ද ඔහුගේ දූතයාගෙන් ද ඔබට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කර ඇත (යන් දැන ගන්න) "

(2 අල් බකරා :279)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් මහා විනාශය ගෙන දෙන මහා පාපයන් හතකින් වළකින්න යැයි, පැවසීය. ජනතාව, "දේව දූතයාණනී! ඒවා කුමක් ද?" යනුවෙන් විමසූහ. ඊට නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා; අල්ලාහ්ට සමාන කිරීම, හූනියම් කිරීම, අයුතු ලෙස නොමරන ලෙසට, අල්ලාහ් ශුද්ධත්වයට පත් කළ ප්‍රාණය ඝාතනය කිරීම, පොළිය අනුභව කිරීම, අනාථයින්ගේ ධනය අනුභව කිරීම, යුධ පිටියෙන් ආපසු දිවීම විශ්වාසවන්ත අසරණයින් පවිත්‍රතාවයෙන් යුතු ස්ත්‍රීන් ගේ අවලාද කීම යනාදිය (මේවගේ මහා පාපයක්) යන්නෙන් පැවසීය (බුහාරී)

පරලොවේ ජයග්‍රහණය කිරීම සෑම මුස්ලිම්වරයකු ගේ පරමාර්ථය විය යුත ය. පොළිය ගන්නා අය පරලොව දී වේදනා සහිත දඬුවම් ලබන බව අල් කුර්ආනය හා නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ගේ හදීස් අපට පෙන්වා දෙයි.

"පොළිය ගැනීම ඔවුන් ට තහනම් කළ ද ඔවුන් එය ලබා ගැනීම (හේතුවෙන්) අයුතු ලෙස ඔවුන් ජනයාගේ ධනය ගිලමින් සිටි (හේතුවෙන් මෙවැනි දඬුවම් දුන්නෙ මු). මෙවන් ප්‍රතික්ෂේප කරන්නන්ට කාෆිර්වරුන් ට (පරලොවේ දී) කටුක වේදනා දෙන දඬුවම්

අප සුදනම් කර ඇත්තෙමු." (4 අන් නිසාඃ161)

දේව දූත නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් පැවසුවේ ය.

අද රාත්‍රියේ (සිහිනෙන්) මිනිස්සු දෙදෙනකු දුටුවෙමි. ඔවුන් මා වෙත පැමිණ ශුද්ධ වූ භූමි ප්‍රදේශයකට මා කැඳවාගෙන ගියෝ ය. අප පා ගමනින් ගොස් ගංගාවකට ළඟා වුයෙමු. මෙම ගංගාවේ යම්කෙනකු සිටියේ ය.එහි ඉව්රේ තවත් කෙනකු තමන් ඉදිරියේ ගලක් තබා ගෙන සිටියේ ය. ගඟ මැද සිටි තැනත්තා ඉන් පිටතට ඒමට තැත් කරන විට එහි ඉව්රේ සිටි තැනත්තා ඔහුට ගල් ගසා ඔහු පෙර සිටි තැනට ම ඔහු ආපසු යන්නට සැලැස්සුවේ ය. එලෙස ඔහු ගං ඉවුර බලා එන සෑම අවස්ථාවක දීම ඔහුගේ මුඛයට ගලින් ගසා ඔහු පෙර සිටි තැනට යන්නට සැලැස්සුවේ ය.

"ඔහු කවුද? (මා කැඳවාගත ගිය පුද්ගලයාගෙන්)" විමසුවෙමි ඊට ඔහු ගංගාව තුළ සිටිනු දුටු තැනැත්තා පොළිය අනුභව කරන්නා යැයි පැවසීය (බුහාරි)

## හරාම් භාණ්ඩ මිළදී ගැනීම හා විකිණීම

කෙනකු තවත් කෙනකුගෙන් අසාධාරණ අයුරින් ලබාගත් දෙයක් මිළ දී ගැනීම හා විකිණීම හරාම්.

මේ ගැන අල්ලාහ් අල් කුර්ආනයේ පහත වැකියෙන් සඳහන් කරයි.

"...විශ්වාස කර යහපත් ක්‍රියා කරන්නන් හැර, ඒකරාශී වන ඔබ අතුරින් කෙනකු තවත් කෙනකුට අසාධාරණකම් කරයි..." (38 සාද් ඃ24)

"හොරකම් කරන ලද භාණ්ඩයක් සොරකම් කරන කළ එකක් බව දැන එම භාණ්ඩය මිළ දී ගන්නවා නම් ඔහුද එම පාපයෙන් ද අපරාදයෙන් ද කොටස් කරුවකු වන්නෝ ය, යැයි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසීය (බයිහකි)"

"හවුල් ව්‍යාපාරයේ දී හවුල්කරුවන්ගෙන් දෙදෙනකුගෙන් කෙනකු තමන්ගේ සගයාට වංචා නොකර සිටිනතාක් කල් ඔවුන් සමඟ තෙවැනි හවුල්කරුවකු ලෙස අල්ලාහ් සිටි යැයි පැවසීය. (අබූදාවූද්)"

වෙළඳාමේ දී හලාල්, හරාම් පිළිපැදීම අත්නොහැරිය යුතු ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පැවසුවේ ය; අල්ලාහ් යුදෙව්වන්ට සාප කරත් වා ලෙසට තෙවතාවක් පවසා නිශ්චිතව ම අල්ලාහ් ඔවුන්ට සත්ව මේධය තහනම් (හරාම්) කළේ ය. ඔවුන් එය විකුණා එම මුදලින් අනුභව කළේ ය. අල්ලාහ් යම් සමාජයකට කුමක් අනුභව කිරීමට හරාම් කළේ ද, එයින් ලැබෙනදේ ද හරාම් කළේ ය. යැයි. පැවසුවේ ය. (අබූදාවූද්)

"හරාම් මඟින් වර්ධනය වූ මස් පිඬුවලට සුදුසු වන්නේ නිරයේ ගින්දර පමණි, යැයි. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් පැවසීය. (තබරාණි)"

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් වැඩි දුරටත් පවසන කල එක් කාලවකවානුවක් පැමිණේවි එවිට ජනයා තමන් උපයන දේ හලාල් ද හරාම් ද යන්න පිළිබඳ නොසලකන්නෝ ය. (බුහාරි)

එලෙසම මත්පැන් සැදීම සඳහා මිදි මිළ දී ගන්නන් හට එය විකිණීම ද හරාම් වේ. තව ද කෝලාහල ඇති කරන්නන් හා ත්‍රස්තවාදීන්ටත් ආයුධ විකිණීමද නුසුදුසු ය. මෙලෙස ම යම් හලාල් වූ භාණ්ඩයක් හරාම් වූ දෙයක් කිරීමට භාවිතා කිරීමට විකිණීම ද වළකා ඇත.

### අභ්‍යාසය

1. ඉපැයීම පිළිබඳ ඉස්ලාම් දහමේ දේශනා කෙටියෙන් පැහැදිලි කරන්න.
2. ඉස්ලාම් තහනම් කළ ඉපැයීම් ක්‍රම වගු ගත කරන්න.
3. පහත සඳහන් ඉපැයීම් ක්‍රම අතුරින් පොළිය, භාණ්ඩ සැඟවීම යන ඒවා ගැන කෙටි සටහන් ලියන්න.